

# මීතුරාගේ දිනපොත

## ඇමතිතුමාගේ වස්තුව

නරුමසේකර ලියා තිබු 'පොලිස් රාළහාමිගේ වස්තුව' කියවීමෙන් මා ලැබුවේ හාස්‍යය මුසුවුණු ආස්වාදයකි. අපේ රටේත් සමාජයේත්, සිදුවන අසාධාරණකම්, වංචා දූෂන ගැන ශෝකී ස්වරයෙන් මා සමග නිතර කතා බස් කළ ඔහුගේ සිතිවිලි නොයෙක් දිසා-වන් කරා යොමු වන්නට ඇත. දැන් ඔහු ලියා ඇති අනිකුත් දේ කියවන තෙක් මට ඉවසිල්ලක් නැත. මම ඊළඟ පිටුව පෙරලුයෙමි. එහි මාතෘකාව කැපී පෙනෙන ලෙස ලොකු අකුරින් ලියා දෙතුන් වරක්ම අකුරු මත යළිත් ලියා ඇති බව මට පෙනී ගියේය. එහි මාතෘකාව ''ඇමතිතුමාගේ වස්තුව'' විය.

**ගෝරිමන්ද** අමාත්‍යවරයා වෙහෙස වී ගෙදර පැමිණියේ ඇඳිරි වැටීගෙන එන වෙලාවේය. දිනපතා මේ වේලාවට ගෙදර පැමිනන අමාත්‍යවරයා පිළිගන්නේ ඔහුගේ සුරතලා වන ටොමියාය. තමා මෙන්ම ටොමියාත් පසුගිය මාස කිහිපය තුළ දුර්වල වී ඇති බව උගේ කෙසඟ සිරුර දෙස බැලූ ඇමැතිතුමාට සිතිණ. තමනට පැවරී ඇති රාජකාරී නිසා ටොමීට නියමිත වේලාවට ආහාර පාන ලබාදීමට නොහැකිවීම නිසාය ඌ කෙට්ටු වී ඇත්තේ.

'මුගේ කෑම ටික දුන්නෙ නැත්ද?''
කහට කෝප්පය රැගෙන තම කාමරයට පැමිණි බිරිඳගේ මුහුණ බලමින් ඇමැතිවරයා ඇසුවේය.
''ඌට කෑම දෙන්න කලින් ඔයාගෙ කෑම ගැන බලන්න එපායැ. අද දවාලටත් හරියට කෑමක් නැතුව ඇති නේද?''

''මොනව කරන්නද උදුම්බරා. රාජකාරි වැඩවලට ගියහම ඔහොම තමයි. අපේ සැප පහසුකම්වලට වඩා ජනතා සුභ සාධනය ගැන එපැයි හිතන්න.''
''අනේ මන්දා, ඔය ඇමැතිකම භාර ගත්තට පස්සේ ඔයා ඇදිලා පැදිල ගිහිල්ලා. කොහෙද හරියට කෑමක් කන එකක් යැ. නිදාගන්නවත් වේලාවක් තියෙනවාද?''

තම බිරිඳ කියු දෙය ඇත්තක් බව ගෝරිමන්ද ඇමැතිවරයාට වැටහුනේ රාත්‍රී නවයට පැවැත්වෙන නාගරික අමද්‍යප සමිතියේ රැස්වීමට යාම සඳහා ඇඳ පැළඳ ගනිද්දිය. ඇමැතිධුරය භාර ගැනීමට පෙර උරහිසේ තද නිසා නොඇඳ පසෙකට දමා තිබු ජාතික ඇඳුමත් ඇඳගත් අමාත්‍යවරයාට එය ඉතා පහසුවෙන් දෙඋරහිස හරහා පහළට වැටුන බව පෙනී ගියේය. අමාත්‍යධූරය භාර ගැනීමෙන් පසු පසුගිය පස් මාසය තුළ ඔහුගේ බර අඩුවී සිරුර කෙට්ටු වී ඇති බව දැන් ඔහුට පැහැදිලිය. එහෙත් ගෝරිමන්ද ඇමතිතුමා මේ ගැන කණස්සල්ලට පත්වුයේ නැත. ඔහු සාර්ථකව පවත්වාගෙන ගිය වෙළෙඳ ව්‍යාපාරය පවා නවත්වා දමා අමාත්‍ය ධුරය භාර ගත්තේ මහජනතාවට සේවයක් කිරීමේ බලාපොරොත්තුවෙනි. ඔහු සැප සම්පත් අතහැර සමාජ සේවයට පිවි-සියේ වාසි ලබන සතුටටත් වඩා ජනතා දුක තුනී කිරීමෙන්, අහිංසක ජනතාව සැනසුම් සුසුම් හෙලනු දැකීමෙන් තමන් ලබන්නා වූ නිහතමානි ආස්වාදය සලකාය. ඔහු බස් නැවතුම් පොළට ගියේත්, ජනතා සුභ සාධනය සඳහා තම කාලයත්, ධනයත් වැය කිරීමෙන් ලැබෙන සන්තුෂ්ටිය ගැන සිහිපත් කරමිනි.
අමද්‍යප සංගමයේ සැසිවාරය පටන් ගැනීමට කලින් එහි යා යුතුයයි සිතූ ඇමතිවරයා සෙනඟ තදබදයද නොතකා කලින්ම පැමිණි බස් රථයට ගොඩවිය. අමාරුවෙන් බස්



ආචාර්ය පාලිත ගනේවත්ත

රථයේ මැදට ඇදි ඇදී ගිය අමාත්‍යවරයා දුටු වාඩිවී සිටි මැදිවියේ වු මහතෙක් නැගී සිටියේය.

*<u>දැවැද්ද වශයෙන් තමනට බිරිඳ ගෙන් ලැබුන ඉඩකඩම් බොහෝමයක් අමාත්‍යධූරය ලැබීමෙන් පසු විවිධ ළමා නිවාසවලට හා අසරණ සරණ සමිති පිහිටුවීම සඳහා විකුණන්නට සිදුවූ බව ගෝරිමන්ද ඇමතිතුමා සිහිකලේ සතුටු සිතිනි.</u>*

''සර් වාඩිවෙන්න මෙතනින්''
''නෑ නෑ ඔහොම ඉන්න. ඉන්න විදියට ඉන්න.'' ගෝරිමන්ද අමාත්‍යවරයා යටහත් පහත් ලෙස කීවේය. එවෙලේම බස් රථය තිරිංග තද කිරීම නිසා අමාත්‍යවරයා ඉදිරියට තල්ලු වී ගොස් ඉදිරි ආසනයේ වැදිණි.

''සර් ඉඳගන්න මෙතනින්'' යි මැදි වියේ වු මහතා යළිත් ආයාචනා කළේය. ඔහුගේ ආයාචනය කන වැටුණු ගෝරිමන්ද ඇමතිවරයාට අමාත්‍යවරයකු ලෙස දිවිරුම් දුන් දා වු සිදුවීමක් මතකයට ආවේය. රජයේ ප්‍රවාහන අමාත්‍යාංශයට අයත් පාවිච්චි කරන ලද මුත් හොඳ තත්ත්වයේ පවතින වාහනය බැගින් කැබිනට් ඇමතිවරුන්ගේ නිල රාජකාරි ගමන් සඳහා ලබාදීමට රජය තීරණය කර ඇති බව අග්‍රාමාත්‍යවරයා නිවේදනය කළ හැටි ඔහුට තවමත් මතකය. සියළුම අමාත්‍යවරුන් එම යෝජනාව ප්‍රතික්ෂේප කළේ එය රජයට හා ජනතාවට අතිරේක බරක් හා මහජන මුදල් නාස්තියක් ලෙස සලකමිනි. මහජනතාව සමගම බස්රථවලින් හෝ දුම්රිය මගින් ස්වකීය රාජකාරි කටයුතුවලට යා හැකි බවට සියළුම අමාත්‍යවරු ප්‍රතිඥා දුන්හ. ගෝරිමන්ද අමාත්‍යවරයා මේ පුවත සිහි කළේ හදපිරි සතුටකින් යුතුවය.

නාගරික අමාද්‍යප රැස්වීමේදී සාකච්ඡාවට භාජනය වුයේ රටපුරා පැතිර ඇති අමද්‍යප ව්‍යාපාරය සම්බන්ධීකරණය සඳහා කාර්යාල ගොඩනැගිල්ලක අවශ්‍යතාවයයි. ස්වේච්ඡා සංවිධානයක් වන බැවින් රජයෙන් ඒ සඳහා මුදල් වෙන් කරවා ගැනීමේ දුෂ්කරතාව ගැන පසුගිය දෙතුන් මස තුළ පැවති රැස්වීම් වාරවලදී සාකච්ඡා වුණු බව ගෝරිමන්ද ඇමතිවරයා සිහි කළේය. විවිධ ව්‍යාපෘති, ආහාර සල්පිල් ආදිය සංවිධානය කරමින් ද ධනවතුන්ගේ ආධාරවලින්ද ගොඩනැගිල්ල ඉදිකිරීමට අවශ්‍ය මුදලෙන් සෑහෙන ප්‍රමාණයක් සපයා ගෙන ඇති බව සාකච්ඡා වාරයේදී හෙළිවිය.

අමාත්‍යවරයා මඳ වේලාවක් කල්පනා කළේය. දැවැද්ද වශයෙන් තමනට බිරිඳ ගෙන් ලැබුන ඉඩකඩම් බොහෝමයක් අමාත්‍යධූරය ලැබීමෙන් පසු විවිධ ළමා නිවාසවලට හා අසරණ සරණ සමිති පිහිටුවීම සඳහා විකුණන්නට සිදුවූ බව ගෝරිමන්ද ඇමතිතුමා සිහිකළේ සතුටු සිතිනි. තව ඉදිරි වී ඇත්තේ පර්චස් විසි හයක ඉඩම් කැබැල්ලකි. එය විකුණා දැමුවහොත් කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීමට අවශ්‍ය ඉතිරි මුදල මෙන් දෙගුණයක් මුදල් ලබාගත හැකිය. දැනට ඉතිරි වී ඇති අවසාන ඉඩම් කැබැල්ල විකුණා දැම්ම ගැන බිරිඳ දොස් නගන්නට බැරි නැත. දියණිය දීග යන දිනක ඇයට දැවැද්ද වශයෙන් දීමටවත් ඉඩමක් ඉතිරි නොවනු ඇත. එහෙත් ගෝරිමන්ද ඇමතිතුමා හැමවිටම තමන්ගේ සේවය අපේක්ෂා කරන මහජන අවශ්‍යතා, තම පවුලේ අවශ්‍යතාවලට වඩා ඉහළින් සැලකුවේය. මහජන සේවයට කැපවුණු මැති ඇමතිවරුන් සියළු ආසා අත්හල මුනිවරයන් මෙන් ජනතාව ගැන පමණක් සිතිය යුතුය යන්න ගෝරිමන්ද අමාත්‍යතුමා නිතරම සිතූ සිතිවිල්ලකි.

තමන්ගේ යෝජනාව ගැන සතුට පළ කරමින් ප්‍රීතිඝෝෂා නැගූ සභිකයන්ගේ හඬ අඳුරේ බස් නැවතුම් පොලේ සිටින තම දෙසවන තුළ තවමත් රැව් පිළිරැව් දෙන්නාක් මෙන් ගෝරිමන්ද අමාත්‍යතුමාට දැණින.


# U.D. Electricals

ඔබේ සියළුම ගෘහ විදුලි අවශ්‍යතා සඳහා

බලයලත් විදුලි ශිල්පි

Registered Electrical Contractors and Licenced Electrician (Rec 17240)

Down lights, Power points,
Sensor lights, Exhaust fans,
Heter lights, Safty switches,
Upgradig fuse boards

All Electrical Work

Call **Upali** 0422 052 425/ 03 97056697
Narre Warren
**Reasonabe Rates + All Work Gurenteed**


# මේ ඔබේ දරුවාද?

අපේ රටේ ඉපදිලා, අපේ රටේම හැදෙන වැඩෙන බොහෝ දෙනා යුරෝපීය රටවල් වලට සංක්‍රමණය වෙන්නෙ හුදෙක් අධ්‍යාපන කටයුතු සඳහා සහ රැකියා අවස්ථාවල් නිසාමයි. ලැබූ අධ්‍යාපනයට සරිලන රැකියාවක්, රැකියාවට සරිලන වැටුපක් නොලැබුණාම ඒ ඒ අධ්‍යාපන සුදුසුකම් වලට වඩාත් සුදුසු රැකියා අවස්ථාවලුත් , ඒ රැකියාවලට සරිලන වැටුප් තලයකුත් හිමිවන නිසා බොහෝ විට අපේ අය යුරෝපීය රටවල් රැකියා සඳහා තෝරා ගන්නවා.

අවුරුද්දක් දෙකක් අධ්‍යාපනය ලබද්දි එහෙම නැත්නම් රැකියා කරද්දි රට ගැන වගේම රටේ පරිසරය, අධ්‍යාපනය, ජීවන වියදම, ලැබෙන පහසුකම් ආදිය සලකා බලන බොහෝ දෙනා මුලින් රැකියාව සඳහා පමණක් තෝරා ගත් රට ඉන් පස්සෙ පදිංචිය සඳහා ද තෝරා ගන්නවා. ඒ තමන්ගේ සුබ විහරණය සඳහා ම පමණක් නොවේ. විශේෂයෙන්ම තම දූ පුතුන්ගේ හෙට දවස යහපත් කිරීම සඳහායි. මෙය කියවන ඔබත් එසේ සංක්‍රමණය වී ජීවත්වීම සඳහා මේ රට තෝරා ගත් අයවලුන් විය හැකියි.

මේ රටේ ජීවත් වෙමින් අපේ සදාචාරය, සභ්‍යත්වය, සංස්කෘතිය රකින සියයට අනූ නමයක පිරිසක් අපි අතර සිටියත් ඉතිරි සියයට එක හෝ සමහරවිට ඉනුත් දශම ගණනක ප්‍රමාණයක් මේ රටේ ගති සිරිත් තදින් වැළඳගෙන ඒවාට අනුව හැඩ ගැසී විදේශිකයන් ලෙසම (අපේ භාෂාවෙන් කිව්වොත් සුද්දන් ලෙස) ජීවත් වෙන්නට ගන්නා දුර්වල උත්සාහයත් අපි දකිනවා. එවැනි අයට තම දූ දරුවන්ට සිංහල භාෂාව ගැන ඇති අල්ප දැනුමත්, නොහැකියාවත් ලොකුකමක්. ඒ බව ඔවුන් අන් අය ඉදිරියේ ප්‍රදර්ශනය කරන්නේත් මහා ආඩම්බරයකින්. ඇත්තටම විවිධ ජාතීන්ගෙන් සැදුණු මේ රටේ මිනිසුන්ගෙන්, මේ සමාජයෙන් අපේ ජීවිත වලට ආදේශ කරගත හැකි හොඳ දේ අනන්තයි. ඒ වගේමයි අපට අප හැඩ ගැසුණු සංස්කෘතියට නොගැලපෙන දේත් බොහෝමයි. මේ හැම දේම අපි පරිස්සමින් තෝරා ගත යුතු වනවා පමණක් නොවෙයි වෙනස් රටක වෙනස් ගති සිරිත් මැද උස් මහත්වන දරුවන්ටද පරිස්සමින් තෝරා බේරා දිය යුතු වෙනවා.
ඇත්තෙන්ම දරුවන්ගේ යහපතම මූලික කරගෙන මේ රටේ ජීවත්වීමට ඔබ ගත් තීරණයේ වැරැද්දක් නැහැ. ඒත් දරුවන් හැදෙන්නන් වාලේ හැදෙන්නට ඇරීම කිසිම කෙනෙක් අනුමත නොකරන දෙයක්.

විශේෂයෙන්ම අප අසා ඇති හැටියට, සමාජය පිළිගත් හැටියට සහ මනෝ වෛද්‍ය පර්යේෂණ මගින් දී ඇති නිගමනයන්ට අනුව දරුවන් වරදට පෙළඹෙන්නේ සමාජයේ වරදින් නොව; හුදෙක් තම නිවස තුළ පවත්නා වාතාවරණය අනුවයි. දමව්පියන්ගේ ආදරය, විශේෂයෙන්ම දෙමව්පියන්ගේ අවධානය නිතරම ලබන දරුවන් වරදට යොමුවීමේ ප්‍රවණතාවය අඩුයි. ඔවුන් යමක් කරන්නට පෙර, වැරදි යයි හැඟෙන දෙයක් අත්හදා බලන්නට පෙර ඒ පිළිබඳව දෙවරක් සිතා බලනවා. හේතුව ඔවුන් දන්නවා ඔවුන් වටා ඔවුන් ගැන විමසිලිමත් වන ශක්තිමත් බැඳීමක් තියෙනවා කියලා. ඒත් දරුවන් අවස්ථාවක් ලදොත් විවිධ වූ අත්හදාබැලීම් වලට පෙළඹෙන්නට පසුබට වන්නේ නැහැ.

එකවර හොඳ දේ තෝරා ගැනීමට තරම් දරුවන්ගේ බුද්ධිය මෝරා නැහැ. ඒ නිසාම බොහෝ විට බොහෝ දරුවන් තමන්ගේ සමීපතයන් තෝරා ගන්නා දේ හොඳ දේ ලෙසින් දකිනවා. ඒවා තම තමන්ගේ ජීවිත වලට ආදේශ කරගන්නවා. මේ නිසාම එවැනි දරුවන්ට වැරදි දේ තෝරා ගැනීමට, වැරදි තීරණ ගැනීමට ඇති අවස්ථාවන් බහුලයි. මේ හේතුව මත දෙමව්පියන් මොනතරම් කාර්ය බහුල වුණත් ඔවුන්ගේ විශේෂ අවධානය, ආදරය දරුවන් කෙරෙහි යොමු විය යුතු වෙනවා.

මං හිතනවා ඕනෑම දරුවෙක්ව දෙමව්පියන් විසින් හැසිරවිය යුතුයි. එයින් අදහස් වෙන්නේ දරුවන්ට දඬුවම් කිරීම නෙවෙයි. අපේ ආච්චි අම්මලාගේ කාලෙ කතාවක් තිබුණලු 'හැඳි නොගා හදන කිරිහෙ-ාද්දත්, නොගහා හදන දරුවත් දෙකම එක වගෙයි' කියලා. මේ රටේ නීතියට අනුව දරුවන්ට දඬුවම් කිරීම තහනම් වුණත් දරුවන් ගේ මුරණ්ඩුකම් ඉදිරියේ අපහසුතාවයට පත්වන දෙමව්පියන් වටපිට බලා දරුවන්ට දඬුවම් කරන හැටි සාප්පු සංකීර්ණ තුළදී දකින්නට පුළුවන්. නමුත් ආදරයත්, ආදර්ශයත් තුළින් දරුවන් හැසිරවීම දරු-වන්ට මෙන් ම දෙමව්පියන්ටද පහසුවක්. දරුවා පිළිබඳ ඉවක් මෙන්ම ඔබෙන් සඟවන යමක් වක්‍රෝර්තියෙන් හෝ දැන ගැනීමට උපායශීලී වීමත් වැදගත්.

මේ තරම් අටුවා ටීකා කියන්නට මාව පෙළඹවූයේ පසුගිය පාසැල් සමයේදී බස් නැවතුමේ නේක ජාතික මිතුරන් අතර දුම්පානය කරමින් සිටි පාසැල් නිල ඇඳුමෙන් ම සැරසුණු යොවුන් සිංහල දියණියක්. ඇයගේ මව්පියන් අතින් ඉටුවිය යුතු යමක් ඔවුන් ගෙන් මග හැරී ඇති බව මට හැඟුණේ ඒ දියණිය ගේ හැසිරීම නිසයි. ඇත්තෙන්ම වෙනස් සංස්කෘතික රටාවක් තුළ හැදෙන අපේ දරුවන් සමාජයට අතාරින්නට අපට බැහැ. නිසි මග පෙන්වීම, ඔවුන්ගේ ලෝකයට ඇතුළු වී ඔවුන්ගේ ප්‍රශ්ණ තේරුම් ගැනීම සහ ඒවා නිරාකරණය කර ගැනීමට උදව් දීම දෙමව්පියන් වශයෙන් ඔබේ යුතුකමක්, වගකීමක්. ඔබේ දරුවා නිවැරදි කර ගන්නට තවමත් ඔබ පමා වැඩි නැහැ. ඔබ ඔබේ දරුවා හොඳින් තේරුම් ගැනීම ඔවුන්ට නිවැරදි දේ තෝරා ගැනීමට මහත් පිටිවහලක් වේවි.


**මේනකා ජයතිලක**

ක්වීන්ස්ලන්තය